රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 296

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1985 ජූනි මස 19 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

රාජකාරියේ යෙදී සිටියදී ආබාධිත වූ නිලධාරීන්ට සහ මරණයට පත්වූ නිලධාරීන්ගේ වැන්දඹුවන්ට හා දරුවන්ට වන්දි

ත්‍රස්තවාදීන් ක්‍රියාකාරීව යෙදී සිටින ඉතාමත් අවදානම් සහිත ප්‍රදේශයක, රාජකාරියෙහි නිරතව සිටියදී ත්‍රස්තවාදී ක්‍රියා නිසා නිත්‍යයෙන් ආබාධිත වන රජයේ නිලධාරියෙකුට, රාජ්‍ය සංස්ථා සේවකයෙකුට හෝ පළාත් පාලන සේවයේ සේවකයෙකුට දැනට පවත්නා හිමිකමකට අතිරේකව, ආබාධය සිදුවූ දිනෙන් පසුව ඔහුට හිමිවන ගෙවීම් වැඩිවීම්ද සමග, ඔහු එම උවදුරු සිදුවන විට ලබමින් සිටි සම්පූර්ණ වැටුප් සහ දීමනාද, ඔහු වයස අවුරුදු 55 ට එළඹෙන තෙක් ගෙවිය යුතුය.

02. ත්‍රස්තවාදීන් ක්‍රියාකාරීව යෙදී සිටින ඉතාමත් අවදානම් සහිත ප්‍රදේශයක, රාජකාරියේ නිරතව සිටියදී රජයේ නිලධාරියෙකු, රාජ්‍ය සංස්ථා සේවකයෙකු හෝ පළාත් පාලන සේවයේ සේවකයෙකු ත්‍රස්තවාදී ක්‍රියා නිසා මරුටුවට පත්වන අවස්ථාවකදී, ඔහුගේ වැන්දඹුවට හා දරුවන්ට, දැනට පවත්නා හිමිකම්වලට අතිරේකව, පහත සඳහන් ගෙවීම් කළ යුතුය.

(අ) මියගිය නිලධාරියා ජීවත්වෙමින් සේවයේ රැඳී සිටියේ නම්, ඔහුට වරින්වර ලදහැකිව තිබූ වැටුප් සහ දීමනා ද සමග, ඔහු ජීවත්ව සිටියේ නම් වයස අවුරුදු 55 තෙක්, මියගිය දිනයේදී ලබමින් සිටි සම්පූර්ණ වැටුප් සහ දීමනා,

(ආ) විශේෂ අවස්ථාවල දී රු. 1,50,000/= ක උපරිමය දක්වා වූ සානුකම්පික දීමනා ක්‍රමය පහත දැක්වෙන බෙදීයාම් පරිදි,

(I) බිරිඳ රු. 75,000/=

(II) දරුවන්

(අ) අවුරුදු 10 සහ ඊට පහළ රු. 18,750/=

(ආ) අවුරුදු 10 ට වැඩි 15ට අඩු රු. 14,065/=

(ඇ) අවුරුදු 15 ට වැඩි 18 ට අඩු රු. 9,375/=

.....2 පිටුව

(III) බිරිඳ මියගොස් ඇත්නම්:

රු.1,50,000/= දරුවන් අතරේ, පහත සඳහන් පදනම මත බෙදී යයි.

| | | |
|---|---|---|
| (අ) | අවුරුදු 10 සහ ඊට පහළ | රු.37,500/= |
| (ආ) | අවුරුදු 10 ට වැඩි 15 ට අඩු | රු.28,125/= |
| (ඇ) | අවුරුදු 15 ට වැඩි 18 ට අඩු | රු.18,750/= |

සටහන: (අ) ඉහත II සහ III යටතේ මුළු අර්ථලාභීන් ගණන 4 දෙනෙකු වනු ඇත. සුදුසුකම් ලබන දරුවන් ගණන 4 දෙනෙකුට වැඩි වන්නේ නම්, මෙම මුදල් ප්‍රමාණය, සියළුම දරුවන් අතර අනුප්‍රමාණිකව බෙදෙනු ඇත.

(ආ) අවිවාහකයන් සම්බන්ධයෙන් ගත්තා විට, මියගිය තැනැත්තාගේ දෙමාපියන් ඔහුගෙන් යැපුනේ නම්, රු.75,000/= දෙමාපියන්ට ගෙවනු ඇත. දෙමාපියන්ගෙන් එක් අයෙකු මියගොස් ඇත්නම්, ජීවත්ව සිටින මවට හෝ පියාට මුළු මුදලම ගෙවිය යුතුය.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සු/-17